රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය
பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு
Ministry of Public Administration, Provincial Councils and Local Government

ස්වදේශ කටයුතු අංශය
உள்நாட்டலுவல்கள் பிரிவு
Home Affairs Division

"නිල මැදුර", ඇල්විටිගල මාවත, කොළඹ 05.
"நில மெதுர", எல்விடிகல மாவத்தை, கொழும்பு 05
"Nila Madura", Elvitigala Mawatha, Colombo 05.

TP : +94 112 050 450
Fax : +94 112 369 971
Email: info@moha.gov.lk
Web : www.moha.gov.lk


මගේ අංකය / எனது இல / My No: HA/02/26/05/03

ඔබේ අංකය / உமது இல / Your No:

දිනය / திகதி / Date: 2025.10.29

සියලුම පළාත් ප්‍රධාන ලේකම්වරුන්,
සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන්,
සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන්,

**<u>විෂ මත්ද්‍රව්‍ය මුලිනුපුටා දැමීම සඳහා වන "රටම එකට ජාතික මෙහෙයුම" වැඩසටහන</u>**

උක්ත කරුණට අදාළව මා වෙත යොමු කරන ලද ජනාධිපති ලේකම්ගේ අංක PS/ADA/S.Add.Sec/9/2025 හා 2025.10.29 දිනැති ලිපිය හා බැඳේ.

02. අප රට වර්තමානයේ මුහුණ දී සිටින අවධානම් සහගත තත්ත්වය කෙරෙහි බලපාන මූලිකම සාධකයක් වන විෂ මත්ද්‍රව්‍ය උවදුර මුලිනුපුටා දැමීම ඉලක්ක කරගත් " රටම එකට ජාතික මෙහෙයුම " සමාරම්භක වැඩසටහන 2025.10.30 වන දින පෙ.ව 10.00 සිට 12.00 දක්වා සුගතදාස ගෘහස්ථ ක්‍රීඩාංගනයේදී ගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වීමට කටයුතු යොදා ඇති අතර, මෙම වැඩසටහන සියලුම රූපවාහිනී හා ගුවන් විදුලි නාලිකා ඔස්සේ සජීවීව විකාශය කිරීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇති බව දන්වා ඇත. (ඇමුණුම 01)

03. එබැවින්, ජනාධිපති ලේකම්ගේ උක්ත ලිපියෙහි සඳහන් උපදෙස් අනුව මෙම වැඩසටහන හා සමගාමීව සියලුම පළාත් සභා, සියලුම දිස්ත්‍රික් ලේකම් කාර්යාල, සියලුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල සහ පළාත් පාලන ආයතනවල කාර්ය මණ්ඩල සම්බන්ධ කරවීමට කටයුතු කරන ලෙස කාරුණිකව දන්වා සිටිමි.

04. තවද, එම ලිපියෙන් දන්වා ඇති පරිදි අවශ්‍ය ඉදිරි කටයුතු සඳහා "රටම එකට ජාතික මෙහෙයුම" ප්‍රතිඥාව සහ එම වැඩසටහන සම්බන්ධයෙන් සකස් කරන ලද පෝස්ටරය ද මේ සමග යොමු කරන බව වැඩිදුරටත් දන්වා සිටිමි.

(signature)

**ඔමාලි විමලරත්න**
අතිරේක ලේකම් ( ස්වදේශ කටයුතු ) (රා.ආ)

දුරකථන අංකය : +94 11 2050363
ෆැක්ස් : +94 11 2369832
විද්‍යුත් ලිපිනය : divadmin@moha.gov.lk

**අත්/කළේ- එජ්. ආලෝකබණ්ඩාර**
ලේකම්
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ
පළාත් පාලන අමාත්‍යාංශය

පිටපත : ජනාධිපති ලේකම්, ජනාධිපති ලේකම් කාර්යාලය - කරු.දැ.ගැ.ස

# ජනාධිපති කාර්යාලය
# சனாதிபதி அலுவலகம்
# PRESIDENTIAL SECRETARIAT

මගේ අංකය :- PS/ADA/S.Addl. Sec/9/2025 දිනය :- 2025.10.29

ලේකම්,
රාජ්‍ය පරිපාලන පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07

**විෂ මත්ද්‍රව්‍ය මුලිනුපුටා දැමීම සඳහා වන "රටම එකට ජාතික මෙහෙයුම" වැඩසටහන**

අප රට වර්තමානයේ මුහුණ දී සිටින අවදානම් සහගත තත්ත්වය කෙරෙහි බලපාන මූලිකම සාධකය වශයෙන් විෂ මත්ද්‍රව්‍ය උවදුර හා විෂ මත්ද්‍රව්‍ය ජාවාරම පෙන්වා දිය හැකිය. මෙම විෂ මත්ද්‍රව්‍ය උවදුරේ ගැඹුර සහ ව්‍යාප්තිය සලකා බැලීමේ දී ආරක්ෂක අංශ විසින් අඛණ්ඩව මෙහෙයුම් සිදු කළ ද එය මුලිනුපුටා දැමීම සඳහා මහජන සහභාගීත්වය සහිත පුළුල් වැඩපිළිවෙලක් හදිසි සහ කඩිනමින් ක්‍රියාත්මක කිරීම පිණිස රජය විසින් මේ වන විටත් ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ගයක් ගෙන ඇත.

2. ඒ අනුව, විෂ මත්ද්‍රව්‍ය උවදුර මුලිනුපුටා දැමීම ඉලක්ක කරගත් "රටම එකට ජාතික මෙහෙයුම" සමාරම්භක වැඩසටහන 2025.10.30 දින පෙරවරු 10.00 සිට ප.ව. 12.00 දක්වා සුගතදාස ගෘහස්ත ක්‍රීඩාංගනයේ දී ගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් සහ ත්‍රෛනිකායික අතිපූජනීය මහානායක ස්වාමීන්ද්‍රයන් වහන්සේලා, අතිඋතුම් අගරදගුරුතුමන්ලා, හින්දු පූජකතුමන්ලා සහ මවුලවිතුමන්ලා සහ සමාජයේ විවිධ කොටස් නියෝජනය කරන පුළුල් ජන සහභාගීත්වයකින් යුතුව පැවැත්වීමට කටයුතු යොදා ඇත. මෙම වැඩසටහන සියළුම රූපවාහිනී හා ගුවන්විදුලි නාලිකා ඔස්සේ සජීවීව විකාශය කිරීමට කටයුතු සූදානම් කර ඇත.

3. මෙම සුවිශේෂී අරමුණ සාක්ෂාත් කරගැනීම පිණිස වැදගත් කාර්යභාරයක් ලෙස, මෙම වැඩසටහන හා සමගාමීව සියලුම පළාත් සභා, දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සහ පළාත් පාලන ආයතනවල, කාර්ය මණ්ඩල සම්බන්ධ කරවීමට කටයුතු කරන ලෙස දැනුම් දෙමි.

4. "රටම එකට ජාතික මෙහෙයුම" ප්‍රතිඥාව රාජ්‍ය පරිපාලන පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ වෙබ් අඩවියෙන් අදාළ සියළුම පාර්ශවවලට බාගත කර ගැනීමට හැකිවන සේ පළකරන මෙන් හා වැඩසටහන සම්බන්ධයෙන් සකසා ඇති පෝස්ටරය ද එම අවස්ථාවට සමගාමීව ප්‍රදර්ශනය කරවීමට අදාළ ආයතන වෙත උපදෙස් ලබා දෙන මෙන් ද වැඩිදුරටත් දන්වා සිටිමි.

ආචාර්ය එන්. එස්. කුමානායක
ජනාධිපති ලේකම්
දුරකථන අංකය :- + 94112354420
ෆැක්ස් අංකය :- + 94112446657
විද්‍යුත් ලිපිනය :- prsec@presidentsoffice.lk

# ප්‍රතිඥාව / දිවුරුම

ශ්‍රී ලංකාව; ඔබ මම ආදරය කරන අපගේ ගෞරවනීය මාතෘභූමියයි. මේ වන විට විෂ මත්ද්‍රව්‍ය උවදුර විසින් අප දේශයේ අනාගතය පිළිබඳ අපේක්ෂාවන්ට බාධා කරවන ජාතික ව්‍යසනයක් නිර්මාණය කරනු ලැබ ඇත. එයින් අපගේ සමාජය පූර්ණ ලෙස මුදා ගැනීම වර්තමානයේ අප හමුවේ ඇති විශාලතම අභියෝගයයි. මෙම අභියෝගය ජය ගැනීම සමාජයක් ලෙස අත්හළ නොහැකි වගකීමක් බව අපි පිළිගනිමු.

මෙකී විෂ මත්ද්‍රව්‍ය උවදුර විසින් අප සමාජයේ ආර්ථික පැවැත්මද,සෞඛ්‍ය සම්පන්න ජීවිතයද, පවුලේ ආදරය සහ බැඳීමද, සතුට සහ විනෝදයද අහිමි කරනු ලැබ ඇත. ඒ හා සමාන ලෙස සංවිධානගත අපරාධවල මූලයක් බවටද එය පත්ව ඇත.

එබැවින් අපි;

විෂ මත්ද්‍රව්‍ය නිෂ්පාදනය, බෙදා හැරීම, අලෙවිය, ප්‍රවර්ධනය සහ ඊට අනුබල දීම මුළුමනින්ම ප්‍රතික්ෂේප කිරීමටත්, එරෙහි වීමටත්, ඊට සම්බන්ධ පිරිස් නීතිය හමුවට පැමිණ වීම සඳහා සහාය වීමටත් ප්‍රතිඥා දෙමු / දිවුරුම් දෙමු.

එසේම, විෂ මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වූවන්ට ඉන් මිදීමට උදව් උපකාර කිරීමටත්, ඔවුන් නැවතත් යහපත් සමාජ ජීවිතයක් කරා රැගෙන ඒමට උපකාර කිරීමටත් ප්‍රතිඥා දෙමු / දිවුරුම් දෙමු.

වර්ෂ 2025ක් වූ ඔක්තෝබර් මස 30 වන දා කොළඹ සුගතදාස ගෘහස්ථ ක්‍රීඩාංගණයේදී "රටම එකට" ජාතික මෙහෙයුම් සමාරම්භක උළෙලේදී අප විසින් ලබා දෙන මෙම ප්‍රතිඥාව අපගේ මාතෘ භූමියෙන් විෂ මත්ද්‍රව්‍ය උවදුර මුළුමනින්ම පිටු දකින තෙක්ම අත් නොහරින ජාතික වගකීමක් ලෙස සලකා ක්‍රියාත්මක වන බවටද ප්‍රතිඥා දෙමු / දිවුරුම් දෙමු.

## Oath/Pledge

Sri Lanka is our esteemed motherland, cherished by both you and me. At present, the spread of dangerous drugs has become a national disaster that undermines the expectations for our nation's future. Completely rescuing our society from this menace stands as the greatest challenge before us. We acknowledge that overcoming this challenge is an unwavering responsibility that we share as a society.

This dangerous drug menace has deprived our society of economic stability, healthy living, family affection and bonds, as well as joy and entertainment. Moreover, it has become a source for organized crimes.

Therefore, we; solemnly affirm/swear to completely reject the manufacture, distribution, sale, promotion and espousing of dangerous drugs, to act against them and to extend our assistance in bringing those responsible to justice.

Similarly, we affirm/swear to support the drug dependent persons in overcoming their addiction and also to assist them in reintegrating into a healthy and dignified social life.

We affirm/swear that this oath, taken at the inaugural ceremony of the '*Ratama Ekata*' National Mission on the 30th day of October, 2025, at the Sugathadasa Stadium, Colombo, shall remain in force as a solemn national responsibility, one that we shall uphold unwaveringly until the dangerous drug menace is completely eradicated from our motherland.

# உறுதியுரை / சத்தியம்

இலங்கையானது நீங்களும் நானும் அன்பு காட்டும் எமது மதிப்பிற்குரிய தாய்த்திரு நாடாகும். விஷ போதைப்பொருள் அச்சுறுத்தலானது எமது தேசத்தின் வளமான எதிர்காலத்திற்கு இடையூறு விளைவிக்கும் தேசிய அனர்த்தமொன்றை தற்போது உருவாக்கியுள்ளது. அதிலிருந்து எமது சமூகத்தை முற்றுமுழுதாக விடுவித்தலானது தற்போது நாம் எதிர்கொள்ளும் மிகப்பெரிய சவாலாகும். இந்த சவாலை வெற்றிக்கொள்வது சமூகம் என்ற வகையில் தவிர்க்க முடியாத ஒரு பொறுப்பாகும் என்பதை நாங்கள் ஏற்றுக்கொள்கின்றோம்.

இந்த விஷ போதைப்பொருள் அச்சுறுத்தலானது எமது சமூகத்தின் பொருளாதார உறுதிப்பாட்டினையும், ஆரோக்கியமான வாழ்க்கையையும், குடும்ப பாசம் மற்றும் பிணைப்பினையும், மகிழ்ச்சி மற்றும் களியாட்டத்தையும் இழக்கச் செய்துள்ளது. அதேபோன்று, இது ஒழுங்கமைக்கப்பட்ட குற்றங்களின் மூலமாகவும் மாறியுள்ளது.

ஆதலால் நாம்;

விஷ போதைப்பொருள் உற்பத்தி, விநியோகம், விற்பனை, ஊக்குவிப்பு மற்றும் அவற்றிற்கு உடந்தையாக இருத்தலை முற்றுமுழுதாக நிராகரிப்போம் என்றும், எதிர்ப்போம் என்றும், அதனுடன் தொடர்பான நபர்களை சட்டத்தின் முன் நிறுத்த உதவுவோம் என்றும் உறுதிச்செய்கின்றோம் / சத்தியஞ் செய்கின்றோம்.

அத்துடன், விஷ போதைப்பொருள் பழக்கத்திற்கு அடிமையானவர்களுக்கு அதிலிருந்து மீள்வதற்கு உதவுவோம் என்றும் அவர்களை மீண்டும் சிறந்ததொரு சமூக வாழ்க்கைக்கு திசைத்திருப்புவதற்கு உதவுவோம் என்றும் உறுதிச்செய்கின்றோம் / சத்தியஞ் செய்கின்றோம்

2025 ஆம் ஆண்டு அக்டோபர் மாதம் 30 ஆம் திகதி கொழும்பு சுகததாச உள்ளக விளையாட்டரங்கில் *"ரட்டம எகட்ட"* தேசிய செயல்பாட்டு அங்குரார்ப்பண விழாவில் எம்மால் அளிக்கப்படும் இந்த உறுதியுரையை எமது தாய்நாட்டிலிருந்து விஷ போதைப்பொருட்களின் அச்சுறுத்தல் முற்றுமுழுதாக ஒழிக்கப்படும் வரை கைவிடப்படாத தேசியப் பொறுப்பொன்றாக கருதி, செயல்படுவோம் என்றும் உறுதிச்செய்கின்றோம் / சத்தியஞ் செய்கின்றோம்.